**ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය - 2017**

**---------------------------------------------------------------**

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් නිසිබලධාරී වෙත 2018 සැප්තැම්බර් 28 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය ව්‍යාවනය**

**-------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 මණ්ඩලයේ අඛන්ඩ පැවැත්ම**

2016 සහ 2017 වර්ෂ අවසානයට මණ්ඩලයේ පිළිවෙලින් රු.525,639,091 ක හා රු.494,151,362 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතුණි. සමාලෝචිත වර්ෂය වන විට මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය 39 දෙනෙකුට සීමාවී තිබූ අතර මණ්ඩලය සතු කම්හල් 09 න් කම්හල් 04 ක් පසුගිය යුධ වාතාවරණය සහ අමුද්‍රව්‍ය හිඟකම හේතුවෙන් වසා දමා තිබුණි. මණ්ඩලයේ කම්හල් සුදුසු ආයෝජකයන්ට බදු දීම හා ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා 2010 වර්ෂයේ සිට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර නිසි බලධාරීවරයෙකු පත්කර තිබූ අතර මණ්ඩලය දිගින් දිගටම පවත්වාගෙන යාම කෙරෙහි මෙම කරුණු අහිතකර ලෙස බලපා තිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව නිමි තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වාර්තා කළ යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.76,818,311 ක නිමි භාණ්ඩ තොගය විකුණුම් මිලට ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10**

මණ්ඩලයට අයත් නිෂ්පාදන කර්මාන්තශාලා 04 ක නිෂ්පාදන කටයුතු 2018 ජනවාරි 25 දින සිට නතර කර තිබූ අතර, මෙම නිෂ්පාදනය නතර කිරීම පිළිබඳව සහ වෑ උඩ උළු කර්මාන්තශාලාව සහ එය පිහිටි භූමිය නව කර්මාන්ත ව්‍යාපෘතියක් සඳහා බදු දීමට අදාළ යෝජනාව පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.150,000 ක වාහන කුළී වියදම් 2017 වර්ෂයේ වාහන කුළී වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, 2017 වර්ෂයේ අවසාන මාස 02 ට අදාළව ගෙවිය යුතු රු.300,000 ක වාහන කුළී ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) නිෂ්පාදන පිරිවැයට ඇතුළත් විය යුතු උළු නිෂ්පාදනය සඳහා වන වෙළඳ බලපත්‍ර ගාස්තු සහ නිෂ්පාදන වියදම් එකතුව රු.215,597 ක් ආයතන හා පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උළු ප්‍රවාහනය කිරීම සඳහා දරන ලද එකතුව රු.2,453,691 ක් වූ වියදම නිෂ්පාදන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සේවකයින් 08 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.123,024 ක් වූ සේවක වැටුප් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද එකතුව රු.751,540 ක වෛද්‍ය දීමනා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ වැලි කැණීම් බලපත්‍ර ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියට සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය වෙත ගෙවන ලද එකතුව රු.284,912 ක වියදම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට උස්වැව කර්මාන්තශාලාවේ එකතුව රු.16,802,930 ක් වූ විකුණුම් බඩු සඳහා වන පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව රු.5,201,313 ක ඍණ අගයක් ලෙස සටහන් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම නිසා වර්ෂයේ දල ලාභය රු.10,402,326 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවිය යුතු වටිනාකම රු.5,000,000 ක් වුවද ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කළ ශේෂ සනාථන ලිපිය අනුව එම වටිනාකම රු.2,005,435 ක් වූයෙන් රු.2,994,565 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 අවිනිශ්චිත ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.2,737,166 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය අදාල ගිණුම් නිවැරදි කිරීමකින් තොරව රඳවාගත් ලාභයට කපාහැර තිබුණි.

### 2.2.6 විගණනයට සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 23,755,784 | හිමිකම් ඔප්පු බලපත්‍ර හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිලි |
| (ආ) වෙළඳ හා වෙනත් ණයගැතියන් | 9,317,527 | ණයගැති ශේෂ සනාථන ලිපි සහ ණයගැති ලිපිගොණු |
| (ඇ) උළු ණය ගිණුම (ආපදා ණය) | 87,460 | ජර්නල් වවුචරය සහ එම වවුචරය සඳහා වූ |

| | | උපකාරක සාක්ෂි |
|---|---|---|
| (ඈ) ගෙවිය යුතු බදු | 175,903,306 | බදු ලිපිගොණු, බදු බැරකම තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිඛිත සනාථන සහ ගණනය කිරීම් ලේඛන |
| (ඉ) ලැබිය යුතු ආදායම් බදු | 1,221,666 | |
| (ඊ) ස්ථාවර වත්කම් | 104,513,418 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (උ) බොල් ණය | 741,207 | විස්තරාත්මක උපලේඛන |
| (ඌ) ණයගැතියෝ | 452,478 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.11,634,693 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 01 ට අඩු වූ ණය ශේෂ වල එකතුව රු.8,904,674 ක් ද, වසර 02 ත් වසර 03 ත් අතර ණය ශේෂවල එකතුව රු.2,316,853 ක් ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.413,166 ක් ද වූ අතර, මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.55,107,544 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 01 ට අඩු වූ ශේෂවල එකතුව රු.2,709,763 ක්ද, වසර 01 සිට වසර 02 දක්වා ශේෂවල එකතුව රු.1,635,154 ක්ද, වසර 02 සිට වසර 03 දක්වා වූ ශේෂවල එකතුව රු.500,000 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.50,262,627 ක්ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ ගෙවා පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135 | මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් ලිඛිතව පවරාදී නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 138 | ගෙවීම් සනාථ කරන ඉන්වොයිස් පත්‍ර සහ සම්බන්ධිත ගොණු විස්තර වවුචරය සමඟ ඉදිරිපත් කිරීමකින් තොරව ගෙවීම් වවුචර් පත්‍ර 08 ක් භාවිතා කර එකතුව රු.555,013 ක් ගෙවීම් කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 394 | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව එකතු වටිනාකම රු.1,592,187 ක චෙක්පත් 25 ක් අවලංගු කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.6 වගන්තිය | කාර්ය සාධන වාර්තාව මාස 03 කට වරක් සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ක් ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (බී) වගන්තිය | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි කර වසර 10 ඉක්මවූ වාහන අපහරණය කළ යුතු වුවත්, මණ්ඩලයේ කර්මාන්තශාලාවල ඇති දැනට භාවිතා නොකරන වාහන 10 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මණ්ඩලය සතු එකතුව රු.38,884,097 ක් වටිනා ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් රථ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,077,618 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.12,500,267 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.24,577,351 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විකුණුම් ආදායම රු.24,217,593 කින් අඩුවී තිබුණද විකුණුම් පිරිවැය 2016 වර්ෂයට සාපේක්ෂව රු.74,813,395 කින් අඩුවී තිබීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී අලාභයක් ලබා තිබූ අතර 2013, 2015, 2016 සහ 2017 වර්ෂ වලදී ශුද්ධ ලාභ ලබා තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී මණ්ඩලයේ දායකත්වය 2013 වර්ෂයේදී රු.35,980,387 ක් වුවද, 2014 වර්ෂය වන විට රු.10,978,743 දක්වා අඩුවී තිබුණි. එහෙත් 2015 වර්ෂයේ රු.51,538,247 ක් වූ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී 2017 වර්ෂය අවසානය වන විට රු.111,216,265 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මණ්ඩලයේ ජංගම අනුපාතය 2015 වර්ෂයේදී 0.34 ක්ව පැවති අතර, 2017 වර්ෂය වන විට එම අනුපාතය 2.33 දක්වා සීඝ්‍ර වර්ධනයක් සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තොගය 2016 වර්ෂයට සාපේක්ෂව රු.55,511,752 කින් ඉහළ යාමත්, 2016 වර්ෂයේ ජංගම බැරකමක් ලෙස ගිණුම්ගත කර තිබූ රු.176,263,306 ක් වූ ගෙවිය යුතු මුළු බදු බැරකම දිගුකාලීන බැරකමක් ලෙස 2017 වර්ෂයේදී ගිණුම්ගත කිරීමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය සංඛ්‍යාත්මකව වර්ධනය වී තිබුණද මුදල් හා බැංකු ශේෂය පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.24,924,059 කින් අඩුවීම නිසා කෙටිකාලීනව ආයතනයේ ජංගම බැරකම් පියවා ගැනීමේ හැකියාව දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

මණ්ඩලයේ ක්ෂණික වත්කම් අනුපාතය 2015, 2016 සහ 2017 වර්ෂ වලදී පිළිවෙලින් 0.12 ක්, 0.21 ක් සහ 0.49 ක් විය. 2016 වර්ෂයේදී රු.31,021,865 ක්ව පැවති මුදල් හා බැංකු ශේෂය 2017 වර්ෂය වන විට රු.6,097,806 ක් දක්වා රු.24,924,059 කින් අඩුවී තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්ෂණික වත්කම් අනුපාතය දුර්වල මට්ටමක පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1.1 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) වගන්තිය අනුව ආයතනය විසින් පිළියෙල කරන ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම්, වාර්ෂික අයවැය ලේඛනය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එකිනෙක අරමුණු ලබා කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

--------------------------------------

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය අනුව සංස්ථාව පිහිටුවා තිබූ අතර, 1958 අගෝස්තු 01 දිනැති ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව දක්වා තිබූ බලතල හා කාර්යයන් ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් කර්මාන්තශාලා 09 න් 04 ක් අමුද්‍රව්‍ය හිඟය සහ යුද්ධය මත වසා දමා තිබුණි. 2017 වර්ෂයේදී මහියංගනය කම්හල පමණක් රු.2,659,720 ක අලාභයක් ලබා තිබූ අතර, එරගම, උස්වැව, යටියන සහ බිංගිරිය යන කර්මාන්තශාලා 04 හි මුළු ලාභය රු.54,266,008 ක් විය.

(ආ) යටියන හා බිංගිරිය කම්හල් 2016 වසරේදී පිළිවෙලින් රු.8,806,596 ක් හා රු.666,821 ක අලාභ ලබා තිබුණද 2017 වර්ෂයේදී එම අලාභය ඉක්මවා ලැබූ ලාභය පිළිවෙලින් රු.625,689 ක් හා රු.3,060,579 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කම්හල් 05 ක නිමි තොග එකතු වටිනාකම රු.75,910,602 ක් වූ අතර, පසුගිය වර්ෂයේ එම කම්හල් 05 හි නිමි තොග එකතු වටිනාකම රු.16,556,354 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිමි තොග වටිනාකම එකතුව රු.59,354,248 කින් ඉහළ යාම මහියංගන කම්හලේ අලාභය අඩුවීමටත්, අනෙක් කර්මාන්තශාලා 04 හි ලාභය ඉහළ යාමටත් හේතු වී තිබුණි.

(ඇ) බිංගිරිය සහ උස්වැව කම්හල්වල අපේක්ෂිත නිෂ්පාදන ධාරිතාවය පිළිවෙලින් ඒකක 1,516,000 ක් සහ 368,000 ක් වන අතර, සත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් ඒකක 292,232 ක් සහ ඒකක 1,114,321 ක් විය. ඒ අනුව බිංගිරිය කම්හලේ නිෂ්පාදනය සියයට 81 කින් අඩුවී තිබූ අතර, උස්වැව කර්මාන්තශාලාවේ නිෂ්පාදනය සියයට 203 කින් ඉහළ ගොස් තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උස්වැව කර්මාන්තශාලාවේ මුළු නිෂ්පාදනය ඒකක 1,114,321 ක් වුවද, මුළු විකුණුම් ප්‍රමාණය ඒකක 357,155 ක් විය. ඒ අනුව නිෂ්පාදනයෙන් සියයට 32 ක් පමණක් අලෙවි වී තිබුණි.

(ඊ) මණ්ඩලයේ නිෂ්පාදන අලෙවි ආදායම 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාර්ෂිකව වර්ධනය වී තිබුණද 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී රු.24,217,593 කින් එනම් සියයට 16.5 කින් පහළ බැස තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් කර්මාන්ශාලා 09 ම දීර්ඝකාලීනව පෞද්ගලික ආයෝජකයන්ට බදු දීමේ මූලික අරමුණ ඇතිව ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව, සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර 2010 ජූලි 01 දින සිට නිසිබලධාරීවරයෙකු පත් කර තිබුණි. ඒ අනුව 2012 මාර්තු 31 දින සිට ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ සේවකයින් විශ්‍රාම ගන්වා තිබුණද 2018 ජූලි 31 දින දක්වා කර්මාන්තශාලා කිසිවක් බදු දීමට කටයුතු කර නොතිබූ අතර, කොන්ත්‍රාත් සහ දෛනික පදනම මත සේවකයින් බඳවාගෙන කර්මාන්තශාලා 05 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසාන දිනට නිමි තොගයේ වැඩිවීම එකතුව රු.59,223,575 ක් විය. එම නිමි තොග වටිනාකමින්ද රු.33,706,824 ක් එනම් සියයට 57 ක නිමි තොගයක් උස්වැව කම්හලේ නිෂ්පාදන අලෙවි නොවීම මත ඉතිරිවී තිබූ අතර, මෙම නිමි භාණ්ඩ තොග අලෙවි කිරීමට කළමනාකරණය පියවරගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මාවතගම වැඩ උළු කර්මාන්ශාලාව සහ එය පිහිටි ඉඩමේ නව කර්මාන්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පෞද්ගලික ආයතන තුනකින් යෝජනා 03 ක් කිසිදු ව්‍යාපෘති යෝජනා කැඳවීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය වෙත ලැබී තිබුණි. එම යෝජනා පදනම් කරගෙන මෙම කම්හල් ගොඩනැගිලි සහ භූමිය බදු දීමේ ක්‍රියාවලිය විගණන පරීක්ෂාවන් සිදු කළ 2018 ජූලි මස වන විට සිදු කරමින් පැවතුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටස 5 (1) වගන්තියට අනුකූලව නිසි පරිදි පාරිතෝෂික ගෙවීම් ගණනය කර නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු නොකිරීම සහ සේවක භාරකාර අරමුදලේ “සී” වාර්තා යොමු කිරීම ප්‍රමාද කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.145,110 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2017 පෙබරවාරි 16 දිනැති ලිපිය පදනම් කරගෙන දේශපාලන හේතූන් මත විවිධ ගැටලුවලට මුහුණ දුන් සේවකයින් දෙදෙනෙකුට සහන සැලසීම සඳහා එකතුව රු.500,000 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

---------------------------

මහියංගනය කර්මාන්තශාලා භූමියේ වසර 15 ත් වසර 20 ත් අතර කාලයක සිට අලෙවි නොවී කම්හල් පරිශ්‍රය තුළ ගොඩ ගසා තිබූ රු.719,165 ක් වටිනා සෙවණ විශේෂ උළු කැට 12,533 ක් එකම ස්ථානයේ ගොඩ ගසා තිබීම නිසා දියවීම හේතුවෙන් තොගයෙන් ඉවත් කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවකයින් ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් මගින් 2012 වර්ෂයේදී ඉවත් කර තිබියදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 9.2 වගන්තිය අනුව ආයතනයකට අනුමත කාර්ය මණ්ඩලයක් සමඟ සංවිධාන සැලැස්මක් තිබිය යුතු අතර, අදාළ සංවිධාන සැලැස්ම සහ අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත්, මණ්ඩලය 2012 වර්ෂයේ ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සේවකයින් වන්දි ගෙවීම් කර ඉවත් කිරීමෙන් පසුව සංවිධාන සැලැස්ම සහ කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයෙකු වෙත මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී රු.50,000 ක්ද, 2017 වර්ෂයේදී රු.340,000 ක්ද ලෙස එකතුව රු.390,000 ක වැටුප් ගෙවා තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

------------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූලි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර, එසේ සැලැස්මක් සකස් කිරීමකින් තොරව එකතුව රු.1,166,207 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ මිලදීගෙන තිබුණි.

(ආ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව ප්‍රාදේශීය මිල ගණන් 04 ක් ලබාගෙන එරගම කර්මාන්තශාලාවට අයත් අක්කර 50 ක කුඹුරු ඉඩම 2017 අගෝස්තු 11 දින සිට 2018 මාර්තු 15 දක්වා කාලයකට රු.565,000 කට පුද්ගලයෙකු වෙත බදු දී තිබුණි.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා 2018 ජූලි 31 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ නිසිබලධාරීවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | ගිණුම් අංශ කටයුතු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයේ ගණකාධිකාරීවරයෙකු සේවයේ නොයෙදීම, ආයතනය තුළ ක්‍රමවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් පසු අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | කම්හල් බඳුදීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක නොකිරීම. |